**මුදල් මාරු කිරීම හා පුහුණු ව්‍යාපෘති මඟින් ආබාධ සහිත පුද්ගලයන්ට ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය (දිරිසවිය) - 2013**

---

මුදල් මාරු කිරීම හා පුහුණු ව්‍යාපෘති මඟින් ආබාධ සහිත පුද්ගලයන්ට ආධාර ලබාදීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2012 නොවැම්බර් 30 දින එළඹි අංක ටීඑෆ් 013135 - එල්කේ දරන ප්‍රදාන ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.06(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, සමාජ සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආබාධිත පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ පරිශ්‍රමයේ කොටසක් වශයෙන් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ දිස්ත්‍රික් නවයක ආබාධිත පුද්ගලයන් සඳහා මුදල් මාරු කිරීම හා පුහුණුව ලබාදීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතිය සංරචක දෙකකින් සමන්විත වේ. එනම් පීඩාවට පත් ආබාධිත පුද්ගලයන් සඳහා මුදල් දීමනා ලබාදීම සහ වෘත්තීය පුහුණු හා කුසලතා සංවර්ධන නියමු වැඩ සටහන ක්‍රියාත්මක කිරීමයි. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය එජඩො 2,590,000 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 නොවැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2015 මාර්තු 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින්

අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(උ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වූයේද යන බව.

## 3. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

## 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පළමු ගිණුම් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.77,214,000 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විස්තරය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම |
|---|---|
| | රු. |
| ආබාධිත පීඩාවට පත් පුද්ගලයන් සඳහා මුදල් දීමනා | 77,214,000 |
| | 77,214,000 |

## 5. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යයන් සිදුකිරීම සඳහා මහ බැංකුවට ලැබී තිබුණු රු.121,485,296 ක් වූ ප්‍රදාන හා දරන ලද රු.77,214,000 ක් වූ වියදම්, ආබාධිත පුද්ගලයන් සඳහා ජාතික සභාව යටතේ ගිණුම්ගත කර තිබුණි. කෙසේ වුවද කාර්යයන් පිළිබඳ ස්වභාවය සභාවේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව, මුදල් වර්ෂය අවසානවීමෙන් දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද , සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2014 ජූනි 18 දිනදීය.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූලායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යායනය කිරීම සඳහා එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය ලේඛනයේ කරන ලද වෙන්කිරීම | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|
| ---------- | -------------------------- | | ---------------- | -------------------------- | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමය | 2.59 | 330.48 | 123.00 | 0.93 | 77.2 |
| | ------ | --------- | -------- | ------- | ---------- |
| එකතුව | 2.59 | 330.48 | 123.00 | 0.93 | 77.2 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආබාධිත පුද්ගලයන් සඳහා දීමනා ගෙවීම 2013 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණද, දීමනා ගෙවීම 2013 අප්‍රේල් මාසයේදී ආරම්භ කර තිබුණි.

(ආ) රු.මිලියන 77.99 ක් වූ ලැබුණු මුළු ප්‍රදාන වලින්, රු.මිලියන 77.21 ක් වූ ප්‍රදාන, ව්‍යාපෘතියේ 01 සංරචකය යටතේ, ආබාධිත පීඩාවට පත් පුද්ගලයන් වෙනුවෙන් මුදල් දීමනා සඳහා උපයෝජනය කර තිබූ අතර ඉතිරි රු.785,994 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයට වැය නොකළ මුදල් ලෙස පැවතුණි. තවද ව්‍යාපෘතියේ 02 සංරචකය යටතේ සිදුකළ යුතු වෘත්තීය පුහුණු හා කුසලතා සංවර්ධන නියමු වැඩ සටහන පිළිබඳ කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ලැබුණු තොරතුරු අනුව, උතුරු දිස්ත්‍රික්ක නවයක ආබාධිත පුද්ගලයන් 2963 ක් තෝරා ගෙන තිබුණු අතර රු.මිලියන 77.21 ක මුදල් දීමනා ඔවුන්ගේ බැංකු ගිණුම් හරහා සෘජුවම ගෙවා තිබුණි. කෙසේ වුවද දිස්ත්‍රික්ක 6 ක ආබාධිත පීඩාවට පත් පුද්ගලයන් ලෙස ව්‍යාපෘතිය විසින් තෝරාගත් වෙනත් පුද්ගලයන් 98 ක් සඳහා මුදල් දීමනා ගෙවීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට ව්‍යාපෘතිය විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. තවද සාවද්‍ය ගිණුම් සංකේත අංක, වලංගු නොවූ බැංකු ගිණුම් යොදා ගැනීම ආදී විවිධ කරුණු හේතුවෙන් බැංකු ගිණුම් මඟින් කරන ලද රු.7,317,000 ක් වූ මුදල් දීමනා පසුව ආපසු එවා තිබුණි.